**ගමන් මඟ**



හදිසි අවශ්‍යතාවයක් සඳහා පසුගියදා මව් බිමට ගිය අවස්ථාවේදී සිංහල සංගීත ක්ෂේත්‍රයේ ප්‍රවීණයින් කීපදෙනෙකු ම මුණගැසීමට ඉඩ ලැබිණ.

ඔවුන'තරින් ඉතාමත් ම කාර්ය බහුලව සිටියේ රෝහණ වීරසිංහයන් ය යන්නයි අපේ අදහස. අපට වීරසිංහයන් සිය නිවසේදී මුණගැසුණෝ ජනාධිපතිවරණයට දින දෙකකට පෙරාතුවයි. කෙතරම් කාර්ය බහුල වුවද පැයක පමණ කාලයක් අප හා අල්ලාප සල්ලාපයෙහි යෙදෙන්නට නො පැකිළිණ වීරසිංහයන්. සමුගැනීමේදී තමන් විසින් රචිත ''ගමන් මඟක් '' ග්‍රන්ථය අපවෙත පිරිනමන්නට අමතක නොකළේය, ඔහු.

, දයාබර සිසිර සහෘදයා වෙත සෙනෙහසින් පිදෙන තිළිණයක් ...? , ඒ දයාබර වීරසිංහයන්ගේ අත් අකුරු , ආදරණීය රෝහණ, නමින් වසර 2002 දී කොළඹ දී පවත්වන්නට යෙදුණා වූ දැවැන්ත සංගීත ප්‍රසංගයෙන් පසුව සිය නිර්මාණ දිවියේ 35 වසරක කඩ ඉම සනිටුහන් කරමින් පැවැත්වූ ප්‍රසංගයත් සමගින් එළිදැක්වුණා වූ ග්‍රන්ථයයි මේ. , ආදරණීය රෝහණ, ප්‍රවීණයාගේ ,ගමන් මඟ, සටහන් අතර ඉතා සුන්දර වූ අත්දැකීම් මෙන්ම කටුක අත්දැකීම් ද, ඉගෙන

***නුදුරේදී සුනිල් එදිරිසිංහ සහ උරේෂා රවීහාරි ශිල්පී දෙපළ සමඟින් රෝහණ වීරසිංහයන් මෙල්බර්න් රසිකයින් ඇමතීමට නියමිතයි.***

ගත හැකි දේ ද බොහෝය. ඉතාමත්ම නිහතමානී ලෙස තමන්ට වැරදුණා වූ තැන් පිළිබඳව ද වීරසිංහයන් සටහන් තබන්නේ අනුනටද ආදර්ශයක් දෙමිනි. එකී සටහන් වලින් සිත්ගත් ජේද කීපයක් උපුටා දක්වන්නටයි මෙවර , ගී සඳළුව, විවර වන්නේ.

,මගේ ප්‍රියතම ගුවන් විදුලි වැඩසටහන ළමා

**ගමන් මඟක් තිබුණා ද මේ**
**ප්‍රේම චාරිකාවේ?**
**ගිමන් හළක් හමුවී ද මේ**
**ප්‍රේම චාරිකාවේ?**

**නෙතින් ගැලූ කඳුළින් - මිදෙන්නට**
**හිතේ සුසුම් ගිනි දැල් නිවා**
**ඔබයි මමයි සැමදා හිඳින්නද**
**ඉරයි - හඳයි තියෙනා තුරා ?**
**අපේ පෙම් ලෝකයේ**

**ගමන් මඟක් විමසා බලන්නට**
**කෙනෙක් නොවී නෙත් මානයේ**
**ඔබත් මුළා විය - මාත් මුළා විණි**
**ඉමක් කොනක් නැති මාවතේ**
**විරහ පෙම් මාවතේ**

පිටියයි. ළමා රංග පීඨය, සරස්වතී මණ්ඩපය ආදී වැඩසටහන් සඳහා සතියේ දිනවල සවස 4 වන විට රේඩියෝව ළඟට යන මා ඒවා රසවින්දේ මහත් උනන්දුවෙනි. චන්ද්‍රා කබ්රාල් හා එස්. ලියනගේ මගේ ප්‍රියතම ගායක ගායිකා යුවල විය., ඔහු සිය ළමා කාලයට පිවිසෙයි. නුවර එළියේ ,විද්‍යා චක්‍ර බෞද්ධ විද්‍යාලයේ , ඉගෙන ගන්නා කාලයේදී තමන්ට ගී ගයන්නට ලැබුණ අවස්ථාවන් වීරසිංහයන් සිහිපත් කරන්නේ මෙලෙසිනි. , සමහර දිනවල ඔහු මයික්‍රපෝන සව්කර මට ගීත ගායනයට ද අවස්ථාව සලසා දුනි. මුළු ගමටම ඇසෙන්න ගීත ගයන්න මම ප්‍රිය කළෙමි. එවැනි අවස්ථාවල මා ගැයුවේ , කරුණාව සමඟ හොඳ හිත පතුරන්න,ල

,මමයි රජකාලේ විහිළු කෙරූ අන්දරේ,ල ,ආදරේ ඇයි පොඩි හද මාමේ, වැනි ගීතය. (පිටුව 10)


සිසිර දිසානායක

වැලිමඩ මධ්‍ය මහා විද්‍යාලයය පිළිබඳව තැබෙන සටහනේ වැකකි කීපයකි මේ. ,සංගීතය, යන අකුරු හතර මගේ ,ජීවිතය, යන අකුරු හතර සමඟ තදින්ම මිශ්‍ර වූයේ එතැන් සිටය. එම විදුහලේ සංගීතාචාර්යවරයා ව සිටි කේ.වී.එස්. පෙරේරා මහතාගෙන් සංගීතය ඉගෙනීම ඇරඹූ මට මා තුළ සැඟවී තිබූ සියළු කලා කුසලතාවන් එළිදැක්විය හැකි වූයේ එහිදීය.'

'ගායනය මෙන්ම සිතාරය, ජලතරංගය, වයලීනය, මැන්ඩලීනය ආදී අතට අසුවුණු හැම භාණ්ඩයක්ම එම වයසේ හැටියට හොඳින් වාදනය කරන්නට මට හැකි විය.' (පිට 12)

'මම ඒ දිනවල නිතර ගුවන් විදුලියේ අසන්නන්ගේ ඉල්ලීම් වෙනුවෙන් තැපැල් පත් යැව්වෙමි. අමරදේව, සුනිල් ශාන්ත, රුක්මණී දේවී, නන්ද මාලනී, නාරද දිසා-



සේකර, සී.ටී. ප්‍රනාන්දු, ජෝතිපාල, මිල්ටන් පෙරේරා, දේවානන්ද වෛද්‍යසේකර, ලතා හා ධර්මදස වල්පොල ආදීන්ගේ ගීත ඒ අතර විය.' (පිට 18-19)

'සංගීත විද්‍යාලයට ඇතුළත් වූ මුල් දිනයේම මට මහත් සතුටක් දැනිණි. හැම දෙසකින්ම ඇසුණේ ශාස්ත්‍රීය ගායන හා වාදනය. වසර පහක පාඨමාලාවක් වූ එහි පළමු වසරේ මා සමඟ සිසුන් 20ක් පමණ වූහ. ලක්ෂ්මන් විජේසේකර, බන්ධුල විජේවීර, ලෙස්ලි විජේවික්‍රම, යන අයද ඒ අතර වූහ. (පිටුව 21)

ප්‍රවීණ සංගීතවේදී ප්‍රේමසිරි කේමදාසයන් හමුවීම වීරසිංහයන් සිහිපත් කරන්නේ ඉතා සිත්ගන්නා සුළු ශෛලයකිනි. වාද්‍ය වෘන්දයක් වෙනුවෙන් කේමදාසයන්ගේ ,මංජරියට, වාදකයින් එක් වූ දිනයකි ඒ.

'තවත් නන්නාදුනන බොහෝ දෙනෙක් කවදාවත් දැක නැති භාණ්ඩ ගෙන අසුන් ගත වෙමින් සූදනම් වන සැටි මා බලා සිටියේ පුදුමයෙනි. වයලීනය මෙන්ම හැඩය ඇති මිනිසෙකුට වඩා උස ඇති දැවැන්ත භාණ්ඩ බිම සිටවා අල්ලා ගත් අයද, එවැනිම හැඩ ඇති ඊට තරමක් කුඩා වූ භාණ්ඩ පුටු මත හිඳ තම කරට හේත්තු කරගත් අයද, නොයෙකුත් වර්ගයේ පපර නළා රැගත් අයද, දඟර ගැසුණු කළ සහිත විශාල පඩික්කම් වැනි භාණ්ඩ උකුල මත තබාගෙන සිටි අයද, මතුපිට සමකින් වැසුණු යකඩින් තැනූ විශාල තාච්චි වැනි භාණ්ඩ ඉදිරියෙන් තබා ගෙන සිටින අය දකිත්ම මේ සිදුවන්නට යන්නේ කුමක් දැයි මා තුළ පැවති කුතුහලය ක්‍රමයෙන් වැඩී එන්නට වූවා මතකය.(පිට 29) මව් බිමේ ප්‍රවීණතම සංගීතවේදියෙකුගේ වාද්‍ය වෘන්දයක් පිළිබඳව මුල්ම අත්දැකීමකි ඒ.

සිය ළඟම සහෘදයෙක් වූ සුනිල් එදිරිසිංහයන්ගේ මුල්ම හමුව පිළිබඳව වීරසිංහයන් මෙලෙස මතකය හැඩවන්නේය. ' මේ සමූහ ගායනය පුහුණුවට යද්දී දිනක් සතිස්චන්ද්‍රයන්ගේ බාල සොහොයුරු සුනිල් එදිරිසිංහ ද, එහි පැමිණ සිටියේය. අප සිතුවේ ඔහුත් අප හා අත්වැල් ගායනයට පැමිණ ඇති බවය. නැත. ඔහු මේ පැමිණ සිටින්නේ චිත්‍රපටයේ ප්‍රධානතම ඒකල ගීතය ගැයීමටය. අපි පසෙකට වී පුහුණු වීම් දෙස බලා සිටියෙමු. ,සඳකඩ පහණක, ගීතය වික්ටර් අයියා අතිශය මධුර ලතාවෙන් ගයා පෙන්වයි. සුනිල් පුහුණු වෙයි.....' (පිට 35)

භාරතයේ සංගීතය හැදෑරීමට ගිය ගමනේදී අත් විඳීමට සිදු වූ ගැහැට අතරින් එකකි මේ,
'එම මැදිරියේ අසුන් සියල්ල ද බඩු තබන ලද උඩ රාක්කවල ද මගීහු පිරී සිටියහ. දුම්රිය තුල එහා මෙහා ගමන් කරන මං තීරුවද සෙනඟින් පිරිලාය. හිටිතැනම හිටගෙන ඉන්නවා විනා කකුල් දෙක මාරු කිරීමටවත් ඉඩක් නොවීය. මේ දින දෙකහමාරක් යා යුතු ගමනක් බව සිහිවත්ම ඇති වූ අසරණකම කියාගත නොහැකි තරම්ය.' (පිට 49)

විශාරද නන්ද මාලනියගේ ,ශ්‍රවණ ආරාධනා , වාද්‍ය වෘන්දයේ සජීවී වාදනයට මුලින්ම සම්බන්ධ වූ අවස්ථාවේ වූ අකරතැබ්බයකි මේ,

'මෙහි බරපතලකම දැනුණේ එවිටය. නන්ද මාලනියගේ ගීත සියල්ලම පාහේ තිබුණේ සිතාරයට අපහසු වූ ,ස්කේල්, වලය. සමහර ගීත වල එක ළඟ කෝමළ ,රි, සහ ශුද්ධ ,රි, යෙදෙද්දී එසේම එක ළඟ කෝමළ ,ධ, සහ ශුද්ධ ,ධ, යෙදෙද්දී මට දඩිය දැම්මා මතකය. (පිට 56)
,ස, ප්‍රසංගය හා වික්ටර් රත්නායකයන් පිළිබඳව සටහන් තබමින් වීරසිංහයන්....

'වික්ටර් අයියා ගීතයක් නිර්මාණය කරන අයුරු බලා හිඳීම ඉතා රසවත් හා මිහිරිතම අත්දැකීමක් විය. පදමාලාව රැගත් කොලය සර්පිනාව මත තබාගෙන එහි ස්වර පුවරුවේ ඒ මේ අතට ඇඟිලි හසුරුවමින් තමාගේ හිතට එන තනුව හෙමිහිට මුමුණමින් පෑන ගෙන පදමාලාවේ පේළි වලට උඩින් ඒ තනුවට අයත් ස්වර මාලා ලියන අන්දම අප බලා සිටියේ මුව අයාගෙනය.' (පිට 85)

පණ්ඩිත් අමරදේවයන් පිළිබඳවද සටහන් තබන්නේය වීරසිංහයන් ,

'රජයේ සංගීත විද්‍යාලයට ඇතුළත් වී ගුවන් විදුලියේ ආධුනික වැඩසටහන් වල සමූහ ගායනා කරමින් සිටි කාලයේ අමරදේවයන් ගේ ,ස්වර වර්ණ, වැඩසටහනේ අත්වැල් ගායනයට සම්බන්ධවන්නට ලැබීම මා ලැබූ උතුම්




භාග්‍යයක් කොට සැළකිය හැකිය.

පසු දවසක එතුමාගේ ,ශ්‍රවණ රමණී, ඒක පුද්ගල ප්‍රසංගයේ අත්වැල් ගායනයටද සම්මාදම් වීමේ මහඟු අවස්ථාව මට ලැබිණ.'

'ඉන් අනතුරුව ,සිගේ ලංකා, සමාගම වෙනුවෙන් නිෂ්පාදනය වුණ නවතම කැසට්පටයක් සඳහා මහාචාර්ය සුනිල් ආරියරත්නයන් රචනා කළ ,තාත්තා වුණත් , හා කුලරත්න ආරියවංශ පද රචනා කළ ,මා වවුලන් රෑ පුරාම, ගීතයත් අමරදේවයන් වෙනුවෙන් නිර්මාණය කරන්නට මට අවස්ථාව ලැබිණ.

'අමරදේවයෝ අපේ සමීප මිතුරු කැළට ඉතා ලෙන්ගතු විය. මා ඇතුළු සුනිල්, ලක්ෂ්මන්, ආනන්ද, සපු, සිසිර (විජේතුංග), කුලේ, එඩ්වඩ් ආදී අපේ මිතුරු කැළ එතුමා විසින් හදුන්වනු ලැබුයේ ,සද්ජන සංගමය, නමිනි.

සංගීත කේෂ්ස්ත්‍රයේ පෙර ගමන්කරුවකු බවට අද පත්ව සිටින රෝහණ වීරසිංහයන් ගේ ගමන් මඟින් ගත් මේ උදෘතයන්ගෙන් එවන් ගමන් මඟක යන්නන්ට ගත හැකි දේ බොහෝය. සිය ගායන කුසලතාවයට වඩා නිර්මාණ කුෂලතාව වෙනුවෙන් නැඹුරුවන්නට තමා විසින් තමා පිළිබඳවම තීරණය ගත් අන්දම ලියැවුණු පරිච්ජේදය ඉන් වඩාත් වැදගත් වේ. මෙල්බර්න් නුවර ,කොන්සට් ශාලාවේ හා සිඩ්නි නුවර ඔපෙරා හවුස් , හිදී පැවැත්වුණු අද්විතීය ප්‍රසංගයන් සිය වඩාත්ම සිත්ගත් ප්‍රසංග ත්‍රිත්වය අතරෙහි ලා සටහන් තබන්නේය වීරසිංහයන්.

නුදුරේදී සුනිල් එදිරිසිංහ සහ උරේෂා රවීහාරී ශිල්පී දෙපළ සමඟින් රෝහණ වීරසිංහයන් මෙල්බර්න් රසිකයින් ඇමතීමට නියමිතයි. එම ප්‍රසංගය, වීරසිංහයන් ආ සංගීතමය 'ගමන් මඟ' කුමාරදාස සපුතන්ත්‍රි ගේය පද පද රචකයාණන් වදනින් මැවූ ප්‍රේමචාරිකාවේ ගමන් මඟට නම් ඉඳුරාම වෙනස් මඟක් බව සියළු රසිකයනට යළිත් පසක් කරවනු ඇත. විශාල ශිල්පී ශිල්පිනියන් පිරිසකගේ ගමන් මං ආලෝකමත් කළා වූ එකී සංගීතවේදියාණන් ගයන ගමන් මඟක් ගිතයේ තනුව හා සංගීතය නිර්මාණය කරන ලද්දේ එඩ්වඩ් ජයකොඩි සුහද විශාරදවරයායි. ■